ශීර්ෂය 337 - කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 337 - කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි මස 09 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 මැයි මස 09 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලූම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මාගේ වාර්තාව කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශිලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) දේපල පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	සමාලෝචිත වර්ෂය තුළ තුරුසවි අරමුදල වෙතින් කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවට ලැබී තිබූ කාර්යාලීය උපකරණ අයිතම 09 ට අදාළ ඒකක 21ක් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.	නිරීක්ෂණය පිළිගනී අදාල වත්කම් තක්සේරු කිරීමෙන් අනතුරුව 2025 ජුනි 30 දිනට ප්‍රථම ලේඛන ගත කිරීමට කටයුතු යොදා ඇති බව.	අදාල වත්කම් තක්සේරු කර නිවැරදිව ප්‍රාග්ධනිත කිරීමට පියවර ගත යුතුය.
(ii)	2024 ජනවාරි 24 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් කුරුඳු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය 2024 ජනවාරි 30 දින කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවට පවරා දී ඇති බැවින් එහි තිබූ වර්ග අඩි 17,812ක් ගොඩනැගිලි 21 ක්ද සණ අඩි 1,125ක් වූ ගොඩනැගිල්ලක ස්වරූපයේ වූ වතුර ටැංකිය, අංශ 09ට අදාළ ඉන්වෙන්ට්‍රි අයිතම හා වාහන 02ක් අගය කර නව දෙපාර්තමේන්තුව යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.	වත්කම් නිසි පරිදි පවරා දුන් පසු වත්කම් තක්සේරු කර පොත් වලට සටහන් කිරීමට කටයුතු යොදා ඇති බව.	එළඹෙන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සැකසීමට පෙර අදාල වත්කම් නිවැරදිව තක්සේරු කර ප්‍රාග්ධනිත කල යුතුය.

(ආ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i) ස්ථාවර වත්කම් ලේඛනය		
2022 දෙසැම්බර් 13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 8.1 ඡේදය ප්‍රකාරව සිගාස් වැඩසටහන තුළ ස්ථාවර වත්කම් මොඩියුලය මගින් වත්කම් ලේඛන පිළියෙල කර යාවත්කාලීන කර නොතිබුණි.	2025 මැයි 15 දිනට ප්‍රථම වත්කම් ලේඛනය යාවත්කාලීන කර අවසන් කිරීමට කටයුතු සම්පාදනය කර ඇති බව.	අනුකූලතාවය නොදැක්වූ නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගැනීමත්, සිගාස් වැඩසටහන තුළ ස්ථාවර වත්කම් මොඩියුලය මගින් ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීමට කඩිනමින් පියවර ගැනීමත් කළ යුතුය.
(ii) පුද්ගල පඩිනඩි ලේඛනය		
මුදල් රෙගුලාසි 453 ප්‍රකාරව පුද්ගල පඩිනඩි ලේඛනයක් පවත්වා නොතිබුණි.	මෙය සකස් කරමින් පවතින අතර 2025 අප්‍රේල් 30දිනට අවසන් කිරීමට කටයුතු යොදා ඇති බව.	අනුකූලතාවය නොදැක්වූ නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගැනීමටත්, මුදල් රෙගුලාසි 453 ප්‍රකාරව 17 වැනි භාණ්ඩාගාර හා විගණන ආකෘතිය පරිදි පුද්ගල පඩිනඩි ලේඛනයක් කඩිනමින් සකස් කිරීමටත් පියවර ගත යුතුය.
(iii) දෙපාර්තමේන්තු විසර්ජන (සම්මත වැය) ලෙජරය		
මුදල් රෙගුලාසි 447 ප්‍රකාරව දෙපාර්තමේන්තු විසර්ජන (සම්මත වැය) ලෙජරයක් යාවත්කාලීන කර නොතිබුණි.	2025 වර්ෂයේ ආරම්භයේ සිට වැය ලෙජරය යාවත්කාලීනව පවත්වාගෙන යන බව	ලේඛන යාවත්කාලීන නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගැනීමටත්, මුදල් රෙගුලාසි 447 හි සඳහන් විධිවිධාන ඇතුළත් වන පරිදි 138 වැනි පොදු පෝර්මය අනුව දෙපාර්තමේන්තු විසර්ජන (සම්මත වැය) ලෙජරයක් පවත්වා ගැනීමත් කළ යුතුය.

(iv) **ඇප ලේඛනය**

මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.	නිලධාරීන්ගේ ඇප මුදල් පිළිබඳ නිර්දේශ අමාත්‍යාංශ ලේකම් වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. ඇප ලේඛනය 2025 ජූලි 31 දිනට ප්‍රථම සකස් කිරීමට කටයුතු යොදා ඇති බව.	මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් සකස් කර පවත්වා ගත යුතුය.

(v) **බැරකම් පිළිබඳ ලේඛනය**

මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි.	2025 වර්ෂයේ සිට නිසි පරිදි බැරකම් ලේඛනය සකස් කිරීමට කටයුතු යොදා ඇති බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව බැරකම් නිතිපතා පරික්ෂා කළ හැකි වන පරිදි බැරකම් ලේඛනය සකස් කළ යුතුය.

(vi) **ණය සහ අත්තිකාරම් ලේඛනය**

2017 ජූලි 05 දිනැති අංක 256/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාරව ණය හා අත්තිකාරම් ලේඛනය පිළියෙල කර යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.	2024 දෙසැම්බර් 31 දිනට මෙම ලේඛනය යාවත්කාලීන කර ඇති බව.	අනුකූලතාවය නොදැක්වූ නිලධාරීන් පිළිබඳව විධිමත් පියවර ගැනීමටත්, අදාළ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව සී.සී.10 ආකෘතිය පදනම් කරගෙන ණය හා අත්තිකාරම් ලේඛනයක් අඛණ්ඩව යාවත්කාලීනව පවත්වා ගැනීමටත් කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 අග්‍රිම කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් මාසයේ අක්මුදල් ඉල්ලීම් නොකළ වවුචර් 14ක් සඳහා එකතුව රු.401,077 ක් ගෙවීම් කර තිබුණි.	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ වී මේ වන විට නිවැරදි කිරීම් කර ඇති බව.	අක්මුදල් ඉල්ලුම් කරන ලද වවුචර්පත්වලට පමණක් ගෙවීම් කිරීමටත්, සිදු විය හැකි විචලනයන් වහාම නිවැරදි කර ගත යුතු අතර මේ සම්බන්ධ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීමට පියවර ගැනීමත් කළ යුතුය.

(ආ)	සමාලෝචිත වර්ෂයේදෙපාර්තමේන්තුව විසින් නිවැරදිව අග්‍රිම ඉල්ලුම් නොකිරීම නිසා ලැබී තිබුණු අග්‍රිමයෙන් සියයට 18 ක් එනම් රු.මිලියන 27.80 ක් නැවත භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර තිබුණි.	ඉදිරියේදී මෙවැනි අතපසුවීම් කිසිදු ආකාරයකට සිදු නොවීමට වග බලා ගන්නා බව.	අග්‍රිම ඉල්ලුම් කිරීම නිසි සැලකිල්ලෙන් සිදු කල යුතු අතර ගණන් දීමේ නිළධාරී මෙය සමීපව අධීක්ෂණය කල යුතු වීම.

2.2 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම	නිර්දේශය
(අ)	ගොඩනැගිලි සහ ඉදිකිරීම් වැය විෂය (2104) සඳහා සමාලෝචිත වර්ෂය තුළ පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන මඟින් රු.මිලියන 70 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණද එම පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 33.56 ක් එනම් රු.මිලියන 23.49 ක් වර්ෂය අවසානයේදී ඉතිරිව තිබුණි. මුදල් රෙගුලාසි 78 (3)(ඉ)(II) ප්‍රකාරව තවදුරටත් වියදම් කිරීමට අවශ්‍ය වන මුදල් සඳහා බිල්පත් නිශ්චිතව හඳුනා ගැනීමකින් තොරව පරිපූරක ප්‍රතිපාදන ඉල්ලුම් කිරීම මත මෙසේ ප්‍රතිපාදන ඉතිරිව තිබූ බව නිරීක්ෂණය විය.	අපේක්ෂා කළ පරිදී ප්‍රමාණවත් බිල්පත් ඉදිරිපත් නොවීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි වීම සිදු වූ බව	සැලසුම් කරන ලද නියමිත දිනට ව්‍යාපෘති අවසන් කිරීම සඳහා අධීක්ෂණය ශක්තිමත් කිරීම හා ඒ අනුව ප්‍රතිපාදන ඉල්ලුම් කිරීම කළ යුතුය.
(ආ)	පුනරාවර්තන වැය විෂයයන් 20 කට අදාල එකතුව රු.මිලියන 27.33 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් හා 2104 ප්‍රාග්ධන වැය විෂය හැර ප්‍රාග්ධන වැය විෂයයන් 07 ක එකතුව රු.මිලියන 32.64 ක ප්‍රතිපාදන ඉතිරිව පැවතුණි.	ක්‍රියාකාරී සැලැස්මට අදාළ කාර්යයන් සියල්ල ඉටු කර ගත නොහැකි වීම වැනි හේතු නිසා ප්‍රතිපාදන ඉතිරි වී ඇති බව	ඉදිරි වර්ෂවලදී ආයතනයේ පවතින සම්පත් හා කාලය සැලකිල්ලට ගෙන ක්‍රියාත්මක කල හැකි ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු බවටත්, ඒ අනුව අවශ්‍ය ප්‍රතිපාදන නිවැරදිව ඇස්තමේන්තු කළ යුතු වීමත් සිදු කළ යුතුය.

2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ දී දෙපාර්තමේන්තුව මිලට ගෙන තිබූ භාණ්ඩ හා සේවා සඳහා රු.252,322 ක ගෙවීම් 2025 වර්ෂයේ ජනවාරි සහ පෙබරවාරි මාසවලදී සිදු කර තිබුණි. එය මූල්‍ය ප්‍රකාශනවල බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශනයට (සටහන III) ඇතුලත් කර නොතිබීමෙන් එම ගෙවීම් සමාලෝචිත වර්ෂයේ බැරකම් ලෙස හඳුනාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය. මෙය 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයට අනුගත නොවීමක් බවද නිරීක්ෂණය විය.	අතපසුවීමකින් බැරකම් ප්‍රකාශයට ඇතුලත් කිරීමට නොහැකි විය.	රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අනුකූලව බැරකම් හෙළිදරව් කළ යුතු අතර වර්ෂ අවසානයට වන සියලු බැරකම් හඳුනාගැනීමට හැකි වන පරිදි අභ්‍යන්තර පාලන වැඩපිළිවෙලක් සකස් කළ යුතුය.

2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

	නිරීක්ෂණය නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	වටිනාකම රු.	අනුකූල නොවීම	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය රෙගුලාසි 138	49,030	සිදුකල නියැදි පරීක්ෂාවට අනුව වවුචර්පත් 13 ක් වියදම් සහතික කිරීමකින් තොරව ගෙවා තිබුණි.	නිරීක්ෂණය පිළිගනී.	වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පරිදි කටයුතු කිරීමටත් අභ්‍යන්තර පාලනය හා පරීක්ෂාව ශක්තිමත් කිරීමටත් පියවර ගත යුතුය.
(ආ)	2020 අගෝස්තු 28 දිනැති 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සංශෝධිත මුදල්		2025 ජනවාරි 31 දිනට පෙර භාණ්ඩ සමීක්ෂණ කටයුතු නිම කල යුතු වුවද	2025 මැයි 05 වන විට සමීක්ෂණ කටයුතු අවසන් කිරීමට සැලසුම් කර	භාණ්ඩ සමීක්ෂණ කටයුතු කඩිනමින් අවසන් කර වාර්තා විගණකාධිපතිටද

	රෙගුලාසි 756(6)	දෙපාර්තමේන්තුව විසින් 2025 මාර්තු 06 එනම් විගණිත දින වන විටත් සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ කටයුතු නිම කර නොතිබුණි.	ඇති බව.	පිටපතක් ඉදිරිපත් කල යුතු වීම හා ඉදිරියේ දී චක්‍රලේඛ නියමයන්ට අනුගතවීමට වැඩපිළිවෙලක් සකස් කර ගත යුතු වීම.
(ඇ)	2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 වගන්තිය	චක්‍රලේඛ ප්‍රකාරව දෙපාර්තමේන්තුව යටතේ පවතින කුරුඳු පර්යේෂණ ආයතනයේ වාහන 02 සම්බන්ධයෙන් ඉන්ධන දහන පරීක්ෂාවක් සිදුකර නොතිබූ බව නිරීක්ෂණය විය.	වාහන 02 හි ඉන්ධන පරීක්ෂාවන් 2025 මැයි 31 දිනට අවසන් කිරීමට කටයුතු යොදා ඇති බව.	වාහන ඉන්ධන දහන පරීක්ෂාවන් කඩිනමින් සිදු කර විගණනය වෙත වාර්තා කිරීමටත්, ඉදිරියේදී චක්‍රලේඛ නියමයන්ට අනුකූලව කටයුතු කිරීමටත් පියවර ගත යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ජාතික කුරුඳු කර්මාන්ත හා සංස්කෘතික ප්‍රවර්ධන මධ්‍යස්ථානය ඉදිකිරීම් සඳහා ඉකුත් වර්ෂවල සහ සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 83.10 ක වියදමක් දරා තිබුණ ද, අදාළ ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිම වී නොතිබූ අතර එහි භෞතික ප්‍රගතිය සියයට 72 ක් පමණක් බව නිරීක්ෂණය විය.	අපේක්ෂිත අයුරින් ඉදිකිරීම් කටයුතු නියමිත දිනට අවසන් කිරීමට නොහැකි වූ නිසා ICTAD/SBD/02 හි 8.4 අනුව දින දීර්සකිරීම සිදුකර ඇති බව	ව්‍යාපෘතිය සමීපව අධීක්ෂණය කර අපේක්ෂිත පරිදි ඉදිකිරීම් අවසන් කළ යුතු වීමත්, මූල්‍ය හා භෞතික ප්‍රගතිය ගණන් දීමේ නිලධාරියා නිරන්තරව පරීක්ෂා කිරීමත් කළ යුතුය.
(ආ)	උචිත තාක්ෂණය භාවිතයෙන් කුරුඳු නිෂ්පාදනවල ගුණත්වය වැඩිදියුණු කිරීම හා අගය එකතු කිරීමේ නිෂ්පාදන සැකසුම් මධ්‍යස්ථාන සඳහා ප්‍රමිත සහතික ලබාදීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම කෙරෙහි සමාලෝචිත වර්ෂයේදීද අවධානය යොමු වී නොතිබුණි.	මේ සඳහා සැලකිය යුතු කාලයක් ගත වන බැවින් මාස 03 ක කාලයකින් එම ව්‍යාපෘතිය ඉටු කිරීම දුෂ්කර බව	අපේක්ෂිත පරිදි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා විධිමත් සැලැස්මක් සකසා ඒ අනුව කටයුතු කිරීමට පියවර ගත යුතුය.

3.2 ප්‍රසම්පාදනය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පවත්නා කුරුඳු වගාවන්හි ඵලදායිතාවය ඉහළ නැංවීමේ වැඩසටහන යටතේ වගා ඉඩම්වල පාළු පැළ සිටුවීම සඳහා සහනාධාර පදනම යටතේ පැළ ලබා දීමට තීරණය කර තිබුණි. මෙහිදී විගණිත දිනය වූ 2025 ජනවාරි 08 දින වන විටත් ප්‍රතිලාභීන් 1,135 ක් සඳහා රු.මිලියන 29.14 ක කුරුඳු පැළ 1,006,970 ක් ලබාදී තිබූ අතර එම පැළ මිලදී ගැනීමේදී නියමිත ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටි අනුගමනය නොකර ප්‍රතිලාභීන්ට ආසන්නතම පැළ තවාන්කරුවන්ගෙන් පැළ ලබා ගෙන තිබුණි. තවද මෙම වැඩසටහන සඳහා අනුමත ගොවි සංවිධාන යටතේ ප්‍රතිලාභීන් තෝරා ගැනීමටද කටයුතු කර නොතිබුණි.	ප්‍රවාහන වියදම් සලකා ප්‍රතිලාභියාට අවශ්‍ය පැල තවානකින් පැල තෝරාගැනීමට ඉඩ සලසා ඇති බව සහ ප්‍රතිලාභීන් තෝරා ගැනීම පිළිබඳ ගොවි සංවිධානවල සාමාජිකයින් දැනුවත් කර ඇති බව	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු නොකිරීම සම්බන්ධයෙන් සහ ගොවි සංවිධාන මඟින් ප්‍රතිලාභීන් තෝරා නොගැනීම සම්බන්ධයෙන් නිලධාරීන්ට අදාලව විධිමත් පරිදි කටයුතු කළ යුතුය.

3.3 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දෙපාර්තමේන්තුව විසින් භාවිතා කරනු ලබන තක්සේරු වටිනාකම රු.මිලියන 21.87 ක් වූ වාහන 04 ක් සහ තක්සේරු වටිනාකම හඳුනා නොගත් තවත් වාහන 03 ක් දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.	පවරා ගැනීමට අදාළ කටයුතු මේ වන විටත් සිදුකරමින් පවතින බව	දෙපාර්තමේන්තුව භාවිතා කරනු ලබන වාහන අදාළ ආයතන වෙතින් පවරා ගැනීමට අප්‍රමාදව කටයුතු කල යුතු බව.
(ආ)	දෙපාර්තමේන්තුව යටතේ පවතින කුරුඳු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානයේ කුරුඳු වගාවේ ඉඩමෙන් අක්කර 7.5 ක ප්‍රමාණයකින් ආදායම් ලබා ගැනීමට අවසන් වසර 10 තුලදීම කටයුතු කර නොතිබුණි.	පර්යේෂකයින්ගේ තීරණය අනුව අදාළ පරිදි අක්කර 10 ක පමණ ප්‍රමාණයක් බදුදීමට කටයුතු කල බව	පර්යේෂණ හා පුහුණු කටයුතු සඳහා යොදාගත් භූමියෙන් ආදායම් උපයා ගැනීමට කඩිනම් වැඩපිළිවෙලක් සකස් කළ යුතු වීම.

(ඇ)	සාමාන්‍ය පාලනයක් යටතේ පවතින කරුඳු වගාවකින් අවම වශයෙන් වසරකට එක් වතාවක් හෝ අස්වනු නෙලාගත යුතු වුවද කුරුඳු පර්යේෂණ ආයතනයේ ක්ෂේත්‍රයේ ඇති කුරුඳු වගාවෙන් අවසන් වසර 10 තුල 2018, 2020, 2022, 2023 හා 2024 වර්ෂවල අස්වනු නෙලීමට කටයුතු නොකිරීම නිසා දළ වශයෙන් රු. මිලියන 10.51 ක පමණ ආදායමක් අහිමි වී ගොස් තිබුණි.	2025 අප්‍රේල් 17 වන දින ටෙන්ඩර්කරු විසින් අස්වැන්න ලබා ගැනීම ආරම්භ කරන ලදි. ඒ අනුව ඉදිරි කාලය තුලදී නිසි පරිදි අස්වැන්න ලබා ගැනීම සිදු කිරීමට කටයුතු කරන බව.	ආදායම් උත්පාදනයට කටයුතු නොකළ නිලධාරීන් සඳහා විධිමත් පියවර ගැනීමටත්, ක්ෂේත්‍රයේ ඇති කුරුඳු වගාවෙන් උපරිම ආදායම් ලබා ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් සකස් කිරීමත් කළ යුතුය.
(ඈ)	කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිර්දේශ වලට අනුව අක්කර 17.5 ක් තරම් වූ කුරුඳු වගාවක කුරුඳු පඳුරු 63,000 ක් තිබිය යුතු අතර විගණනයට ලබා දුන් තොරතුරු අනුව කුරුඳු පර්යේෂණ ආයතන ඉඩමේ පැල 45,000ක අඩුවක් පැවතුණි. ආදර්ශමත් ලෙස වගාව පවත්වා ගත යුතු කුරුඳු පර්යේෂණ ආයතනය, මෙම ඉඩමේ කුරුඳු වගාව මනා කළමනාකාරීත්වයකින් යුක්තව පවත්වාගෙන නොතිබීම හේතුවෙන් ලබා ගත හැකිව තිබූ සැලකිය යුතු ආදායමක් අහිමි වී තිබුණි.	කාලයත් සමඟ මිය යන පඳුරු හඳුනා ගෙන පාළු පැළ සිටුවීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදුකරමින් පවතින බව	පර්යේෂණ ආයතනයක් වශයෙන් ආදර්ශමත් වගාවක් පවත්වා ගෙන යාමට කටයුතු කල යුතුය.

3.4 කළමනාකරණ දූර්වලතා

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව ස්ථාපිත කිරීමට සහ කාර්යාල පහසුකම් සඳහා මාසිකව රු.300,000 ක කුලියකට 2023 දෙසැම්බර් 06 සිට 2026 දෙසැම්බර් 05 දක්වා ඉදිරි වර්ෂ 03 ක කාලයක් සඳහා පෞද්ගලික පාර්ශවයකට අයත් නිවාස ගොඩනැගිල්ලක් යොදාගෙන තිබුණි. නමුත් ආයතනය සඳහා නිත්‍ය ගොඩනැගිල්ලක් ඉදිකිරීමට අවශ්‍යතාවය 2025 වර්ෂයේ ක්‍රියාකාරී සැලසුමෙන් ද හඳුනාගෙන නොතිබුණි.	සුදුසු රජයේ ගොඩනැගිල්ලක් නොමැති වීම නිසා වසර 03 ක් සඳහා කුලී පදනම මත ලබා ගත් බව	රජයේ කාර්යාල රජයේ ගොඩනැගිලි තුළම පවත්වාගෙන යාමේ රජයේ ප්‍රතිපත්තියට අනුගතවීමට කඩිනම් පියවර ගත යුතු වීම.

(ආ)	සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 1.32 ක වියදමක් දරා ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යන කුලී ගොඩනැගිල්ලේ විවිධ ඉදිකිරීම් සිදු කර තිබුණි. රජයේ ස්ථිර ගොඩනැගිල්ලක දෙපාර්තමේන්තුව ස්ථාපිත කිරීමෙන් තොරව මේ අයුරින් දරන වියදම් නිෂ්කාර්ය වියදම් බවට පත්විය හැකි බව විගණනයේ දී නිරීක්ෂණය විය. තවද ගොඩනැගිල්ලේ බදු දීමනාකරු සමග මෙම ඉදිකිරීම් සම්බන්ධව ඇතිකර ගත් එකඟතා පිළිබඳව තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	මෙම සියලුම ඉදිකිරීම් ගලවා ඉවත් කල හැකි අයුරින් සිදුකර ඇති බැවින් නිෂ්කාර්ය වියදම් නොවන බව	ආර්ථික බවින් යුතුව කටයුතු කිරීම සඳහා කඩිනමින් රජයේ සුදුසු ගොඩනැගිල්ලක් වෙත දෙපාර්තමේන්තුව රැගෙන යාමට පියවර ගත යුතු බව.

4. යහපාලනය

4.1 මහජනයා වෙත සේවා ඉටු කිරිම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කුරුඳු වගාවට අදාළ දත්ත රැස්කිරීමේ හා විශ්ලේෂණ කටයුතු සඳහා භාවිතා කිරීම වෙනුවෙන් 2016, 2017 හා 2019 යන වර්ෂයන්හිදී කුරුඳු පර්යේෂණ ආයතනයට ලැබී තිබූ එකතු වටිනාකම රු.මිලියන 25.35 ක් වූ යන්ත්‍ර හා උපකරණ අයිතම 06 ක් සහ මිලදී ගත් වටිනාකම සඳහන් නොවූ යන්ත්‍ර හා උපකරණ අයිතම 02ක් 2021 සිට 2024 කාල පරාසයක් තුළ අක්‍රිය තත්ත්වයට පත්වී තිබීම හේතුවෙන් 2025 ජනවාරි 09 දිනට වර්ග 03 කට අයත් විවිධ පරීක්ෂණ 4,820 ක ප්‍රමාණයක් සිදු කිරීමට නොහැකි වී තිබුණි.	අදාල උපකරණ යථාතත්වයට පත් කර ගැනීම සඳහා වූ අලුත් වැඩියාවන් 2025 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් කර ඇති බව හා අක්‍රිය උපකරණ අළුත්වැඩියා කරගෙන නැවත ආදායම් උත්පාදනයට අවශ්‍ය පියවර ගනිමින් පවත්නා බව.	මෙකී යන්ත්‍ර හා උපකරණ කඩිනමින් අළුත්වැඩියා කර වගාවන්ට අවශ්‍ය තොරතුරු රැස් කිරීමේ හා විශ්ලේෂණ ක්‍රියාවලීන්ට දායක කර පරීක්ෂණ සිදු කිරීමට කඩිනම් වැඩපිළිවෙලක් යෙදිය යුතුය.

(ආ)	පර්යේෂණ සිදු කිරීමේදී ඒ සඳහා අවශ්‍ය උපකරණ නොමැති වීම, අවශ්‍ය පුහුණු වීම් නොලැබීම, පරීක්ෂා කරන ලද නිෂ්පාදන වාණිජකරණය කිරීමේ ගැටළු හේතුවෙන් පර්යේෂණයන් සාර්ථකව අවසන් කර ඉන් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමේ ප්‍රශ්නගත තත්ත්වයක් පවතින බව නිරීක්ෂණය විය.	නිරීක්ෂණය පිළිගනිමි.	නිශ්චිත කාල රාමුවකට යටත්ව පර්යේෂණ සිදුකිරීම සඳහා අවශ්‍ය උපකරණ, පුහුණු අවශ්‍යතා සැපිරීම හා පරීක්ෂා කරන ලද නිෂ්පාදිත වාණිජකරණය කිරීමට අදාළ ගැටළු කඩිනමින් නිරාකරණය කර ගෙන ආයතනික අරමුණු ඉටු කර ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් කඩිනමින් සකස් කළ යුතු බව.

4.2 අභ්‍යන්තර විගණනය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 133 හා 134 යන රෙගුලාසිවල දැක්වෙන විධිවිධානයන් සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1) ඊ වගන්තිය ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබූ අතර අභ්‍යන්තර විගණක තනතුර මේ දක්වා පුරප්පාඩුව පැවතුණි.	අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩුව පැවතීම හා නිලධාරීන් ප්‍රමාණවත් නොවන බව.	අදාල විධිවිධාන ප්‍රකාරව අභ්‍යන්තර විගණන අංශයක් කඩිනමින් ස්ථාපිත කල යුතු වීම.

5. මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත තනතුරුවල පුරප්පාඩු 45 ක් පැවති බව නිරීක්ෂණය විය. මෙයින් ප්‍රධාන වශයෙන් කුරුඳු සංවර්ධන නිලධාරී තනතුරෙහි පුරප්පාඩු පැවතීම නිසා ආයතනික අරමුණු ඉටු කර ගැනීමේදී එය	බඳවා ගැනීම සඳහා නිර්දේශ සහිතව රාජ්‍ය සේවා කොමිෂන් සභාව යොමු කර ඇති නමුත් බඳවා ගැනීමේ පටිපාටිය මෙතෙක් අනුමත වී නොමැති බැවින් බඳවා ගැනීම ප්‍රමාද වී ඇති බව	බඳවා ගැනීමේ පටිපාටිය කඩිනමින් අනුමත කරවා ගැනිමටත් ඒ අනුව ආයතනික අරමුණු ඉටු කර ගැනීමට අත්‍යාවශ්‍ය තනතුරු සඳහා බඳවා ගැනීමට හෝ රජයේ ප්‍රතිපත්ති අනුව ආයතනික අතිරික්තතා හා ඌනතා කළමනාකරණය කර ගනිමින් දෙපාර්තමේන්තුවේ අත්‍යාවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කල යුතු වීම.

	බාධාකාරී බවද නිරීක්ෂණය කෙරේ.		
(ආ)	දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් හා පරිපාලන කටයුතු සම්බන්ධයෙන් ප්‍රධාන කාර්ය භාරයන් ඉටුකරනු ලබන පරිපාලන නිලධාරී, ගණකාධිකාරී (ස්ථීර), තාක්ෂණ නිලධාරීන් යන තනතුරු සඳහා කිසිවකු සේවයේ යොදාගෙන නොතිබුණු අතර එම තනතුරුවලට අදාල නිලධාරීන් 05 පුරප්පාඩු පැවතුණි. තවද ගණකාධිකාරී තනතුර සඳහා වැඩ බැලීමේ පදනම මත නිලධාරියකු අනුයුක්ත කර තිබුණි.	නිලධාරීන් අනුයුක්ත කර ගැනීමට අදාළ රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ වෙත යොමු කර ඇති බව	ආයතනික අරමුණු ඉටු කර ගැනීමට අදාළ ප්‍රධාන තනතුරු සඳහා නිලධාරීන් කඩිනමින් අනුයුක්ත කර ගැනීම සඳහා කටයුතු කළ යුතු වේ.